**සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම 2017**

**---------------------------------------------------**

සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය , සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබදව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබද සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබදව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබද ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4. මතය ව්‍යාචනය සඳහා පදනම**

**-------------------------------**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පැවති රු.8,290,423 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් හෝ විස්තරාත්මක උපලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් එම වත්කම්වල තක්සේරුව නිවැරදිතාවය සහ පරිපූර්ණත්වය තහවුරු කරගත නොහැකි විය. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව

ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ භාවිතා කළ ක්ෂය ප්‍රතිපත්තිය හා ක්ෂය ප්‍රතිශත ගිණුම් සමග හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාගම විසින් 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ පිළිබඳ භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.17,565,649 ක් වටිනා භාණ්ඩවල තක්සේරුව, නිරවද්‍යතාව හා පරිපූර්ණත්වය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඇ) මෙම සමාගම ආදයම් බදු, එකතු කල අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීම සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1. මතය ව්‍යාචනය

-----------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමා කිරීම ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) ඉහත දක්වා ඇති පරිදි විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබාගෙන නොමැති බවත්, එසේ හෙයින් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කළනොහැකි බවත් මා දරන්නාවූ මතය වේ.

## 2.2 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-------------------------------------------------------------

**පහත සඳහන් නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| <u>නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම්</u> |
| --- | --- |
| (අ) 1988 අංක 56 දරන සහ 2000 අංක 53දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 23 (අ) වගන්තිය | වාහන සේවා කටයුතු සිදුකරන ආයතන විසින් ඊට අදාලව බලපත්‍රයක් ලබාගත යුතු වුවද, සමාගම 2019 මාර්තු 20 විගණිත දින වන විටද බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 60 වගන්තිය | සමාගමක් ආදායම් බදු ගෙවීම සඳහා නීතියෙන් බැඳී සිටින අතර, සමාගම 2019 මාර්තු 21 විගණිත දින දක්වා අදාල අවශ්‍යතාවය සපුරාලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) 2000 අංක 33 දරන කර්මාන්තශාලා ආඥාපනත<br>(i) 12 (1) වගන්තිය | කර්මාන්තශාලා තුල පිරිසිදු වාතය ලැබීමෙන් ප්‍රමාණවත් වාතාශ්‍රය හා කර්මාන්තයක් නිසා ඇතිවිය හැකි සනීපයට අහිතකර වූ සියළු දුම්, දූවිලි හා වෙනත් අපිරිසිදු දේ හානිකර නොවීම සඳහා ද සුදුසු ප්‍රබල විධිවිධාන |

| | |
|---|---|
| | සැලැස්විය යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 13 (1) වගන්තිය | කර්මාන්තශාලාවේ සෑම කොටසකටම ප්‍රමාණවත් වූද, සුදුසුවූද, ස්වාභාවික හෝ කෘතිම ආලෝකයක් ලබාගැනීම හා පවත්වා ගැනීම සඳහා විධිවිධාන සලසා නොතිබුණි. |
| (iii) 39 (1 ) වගන්තිය | කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි යෙදී සිටින තැනැත්තන්ට එක් එක් අවස්ථාවලදී ගින්නක් ඇතිවු විට යුක්ති සහගතව අවශ්‍යාවිය හැකි බේරීමේ මාර්ග සපයා තිබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (iv) 42 (අ) (1) වගන්තිය | සෑම කර්මාන්තශාලාවකම ගිනි නිවන උපකරණ ඒ සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව සපයා තිබිය යුතු නමුත්, සමාගම විසින් මෙම කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. |
| (v) 50 (1) වගන්තිය | නියමිත සම්මතයක ප්‍රථමාධාර පෙට්ටියක් හෝ රාක්කයක් ලේසියෙන්ම ලභාවිය හැකි වන පරිදි පවත්වාගෙන යායුතු නමුත්, සමාගමේ අවධානය ඒ සඳහා යොමුවී නොතිබුණි. |
| | කර්මාන්තශාලාව තුළ සේවය කරන තැනැත්තන්ගේ ඇස් ආරක්ෂාකිරීම සඳහා සුදුසු පිළිවෙත් සලස්වා තිබිය යුතු නමුත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (vi) 53 (1) වගන්තිය | සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2016 -2019 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2019 ජනවාරි වන විටද ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.3 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) 1978 දෙසැම්බර් 18 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මිල කැඳවීම සඳහා වු ඉල්ලීම් තනි, තනි පුද්ගලයන්, සමාගම් වෙත යවනු ලැබිය යුතු වුවත්, සමාගම බස් රථ බොඩි අළුත්වැඩියාවට අවශ්‍ය රු.29,272,266 ක්වූ තහඩු, යකඩ, තීන්ත හා අමතර කොටස් මිලදී ගැනීමේදී එසේ ඉල්ලීම් කැඳවා නොතිබුණි. |
| (ඊ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 3.4.2 (අ) වගන්තිය | දැන්වීම් පල කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමින් යුතු අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා වන එක් එක් අයිතමයන් මිළදී ගැනීම සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදු කර නොතිබුණි. |

(ii) 3.4.3 වගන්තිය

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,677,568 අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,085,860 විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,591,694 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ බස්රථ අලුත්වැඩියා ආදායම රු.9,591,694 කින් වර්ධනයවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**04. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්යය සාධනය**

------------------

2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව පූර්ණ අර්ධ හා අනතුරු අළුත්වැඩියා ලෙස බස් රථ 88 ක් අළුත්වැඩියා කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී බස් රථ 68 ක් පමණක් අළුත්වැඩියා කටයුතු සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බස් රථ බොඩි අළුත්වැඩියාවන් සඳහා අළුත්වැඩියා කණ්ඩායම් වෙත බස් රථ ලබාදීමෙන් පසු අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට දින 10 සිට දින 69 දක්වා ප්‍රමාද වී තිබුණු අවස්ථා 10 ක් නිරීක්ෂණය විය.

(ii) 2019 මාර්තු 13 දින සිදුකරන ලද භෞතික විගණන පරික්ෂාවේදී බස් රථ 47 ක් අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පැවති අතර, බස් රථ 22 ක අළුත්වැඩියා කටයුතු සඳහා මාස 3 ක පමණ කාලයක් ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) කොන්ත්‍රාත් කණ්ඩායම් සඳහා බස් රථ බොඩි අළුත්වැඩියා කටයුතු සඳහා නිශ්චිත කාලයක් තීරණය කර තිබුණද, 2018 හා 2019 වර්ෂවලදී කොන්ත්‍රාත් කණ්ඩායම් අංක 07 සඳහා බස් රථ 15 ක් අළුත්වැඩියා කටයුතු සඳහා ලබාදී තිබුණු අතර, ඉන් බස් රථ 08 ක් නියමිත කාලය තුලදී කාර්යය නිමකර නොතිබුණි.

(iv) ශ්‍රම පිරිවැය ගණනය කිරීමේදී කොන්ත්‍රාත් ශ්‍රම කණ්ඩායමක සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන් ශ්‍රම පිරිවැය ගණනය කිරීම සිදු කරන අතර සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී ශ්‍රමිකයින් 4 කට අඩු ප්‍රමාණයක් සේවයේ යෙදී සිටි අවස්ථා 08 ක් නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**-------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) සමාගමේ ප්‍රධාන කාර්යය වූ බස්රථ බොඩි අළුත්වැඩියා කටයුතු සඳහා ඉංජිනේරු අංශයක් සමාගම සතුව පැවතියද, එක් බස් රථයක් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය (යකඩ, තහඩු, ඇණ ,තීන්ත ,කුෂන් යනාදිය) ඇස්තමේන්තුව සකස් කර අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම සිදු නොකරන අතර අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන අවස්ථාවේදී ගබඩාවෙන් අමුද්‍රව්‍ය ලබාගැනීම සිදුකරයි. ඇස්තමේන්තුවට අනුකූලව අමුද්‍රව්‍ය මිලදී නොගැනීම නිසා, අක්‍රමවත් ලෙස අමුද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු වන අතර, එමගින් ආයතනයට අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) පවතින ක්‍රමවේදය අනුව ඉන්වොයිස් සකස් කිරීම සියයට 20 ක ලාභාංශයක් එකතු කර සිදු කලද, සමාගමේ දළ ලාභ අනුපාතය 2016 සහ 2017 වර්ෂයන්හි ආසන්න වශයෙන් පිළිවෙලින් සියයට 12ක් හා සියයට 15 ක් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) බස් රථ ආදායම හඳුනාගැනීමේදී ඉන්වොයිස් පත්‍ර සකස් කිරීම තර්කානුකූල පදනමක් මත සිදු නොකරන බව නිරීක්ෂණය විය. එහිදි ඉන්වොයිස් පත්‍ර අනුව 2017 වර්ෂයේ බස් රථ වල විකුණුම් පිරිවැය රු.71,340,156 ක් වූ අතර, වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි විකුණුම් පිරිවැය ලෙස රු.77,400,082 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 6,059,927 ක වෙනසක් නිරීක්ෂණය විය. ඉන්වොයිස් පත්‍ර සකස් කිරීමේදී පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම ශ්‍රම පිරිවැයෙන් සියයට 30 ක් ලෙස ගෙන තිබු අතර, එම ප්‍රතිශතය අන්තර්ග්‍රහණය කිරීම සඳහා පදනම කුමක්ද යන්න විගණනයට තහවුරු නොවුණි.

(ඈ) ද්‍රව්‍ය පිරිවැය සහ ශ්‍රමපිරිවැය මත පමණක් පදනම්ව නොනිමි තොග ගණනය කර ඇති අතර, මේ සඳහා පොදු කාර්යය පිරිවැයද එකතු කර නොනිමි තොග ගණනය කළ යුතු බව නිරීක්ෂණය වූ අතර, ඒ අනුව නොනිමි තොග අඩුවෙන් ගැනීම තුලින් ලාභය අඩුවෙන් පෙන්නුම් කරනු ලබන බව නිරීක්ෂණය විය.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) 2016 අප්‍රේල් 07 දින රු.524,900 ක් වටිනා සිසිටිවි කැමරා හා උපාංග 16ක් මිලදී ගෙන තිබුණු අතර, එම කැමරා ආරම්භක අවස්ථාවේ සිටම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණු අතර, 2019 මාර්තු 13 විගණිත දින වන විට එක් කැමරාවක් පමණක් ආයතන පරිශ්‍රය තුල දක්නට ලැබුණි. මේ සම්බන්ධයෙන් සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර, අදාල සමාගම සමග ගිවිසුමකට එළඹී නොතිබීම නිසා සමාගමට වූ අලාභය අයකර ගැනීමටද, නොහැකි වී තිබුණි.

(ආ) ඒකල පිහිටි අක්කර 23 ක භූමි ප්‍රදේශයක සමාගම පවත්වාගෙන යන අතර, අංශ 1 වැඩබිමේ ආරක්ෂක කම්බි වැට ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.124,000 කට මිලදී ගනු ලැබූ කම්බි රොල් 20 න් 06 ක් පමණක් භාවිතා කර තිබුණි.

(ඇ) බස් රථ අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලබන බාහිර කොන්ත්‍රාත් කණ්ඩායම් වෙත අවශ්‍ය ආවුධ හා උපකරණ සමාගමේ ආවුද ගබඩාවෙන් නිකුත් කළද, ඒවා දිනපතා ගබඩාවට ලබාදිය යුතු වුවත්, එසේ ගබඩාවට ආපසු ආවුද ලබාදීමේ ක්‍රමවේදය

ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. තවද එම ආවුධ උපකරණ කැඩී ගිය විට පමණක් නැවත ගබඩාවට ලබාදෙන බව නිරීක්ෂණය විය.

(ඇ) සමාගමේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පරික්ෂාවේදී සමාගම විසින් සියළුම ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන සැලැස්මකට අනුව සිදු නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම අමතර කොටස් හා බස්ර රථ බොඩි අළුත්වැඩියාවට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී ආර්ථික ප්‍රතිලාභ ලැබෙන පරිදි අමුද්‍රව්‍ය හා අමතර කොටස් මිලදී ගැනීම් සිදුකර නොතිබුණු ඇතැම් අවස්ථාවලදී, අමුද්‍රව්‍ය හා අමතර කොටස් තොගය ගබඩාවේ ශුන්‍ය වීමෙන් පසු මිලදී ගැනීම් සිදුකර තිබුණි.

**4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------------**

23 ශ්‍රී 3872 මෝටර් කෝච් රථය හා 61/9401 ශ්‍රේට්වෝල් බස් රථය බලපත්‍ර නොමැති වීම මත ධාවනය කිරීමට නොහැකි වී තිබුණි. මෙම වාහන වල අයිතිය සමාගම සතුව නොපැවතීම මත බලපත්‍ර ලබාගැනීමට නොහැකිවී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. මෙම බස් රථ 02 වසර 02 ක කාලයක් සිට ආයතන භූමියේ දිරාපත් වෙමින් පැවතුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

**----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 121 ක් වූ අතර, ඉන් සේවකයන් 60 ක් ස්ථිර පදනම මතද, 30 ක් අනියම් හා 12 ක් කොන්ත්‍රාත් පදනම මතද, බඳවාගෙන තිබුණු අතර, ඉන් තනතුරු 36 ක් පුරප්පාඩුව පැවතුන අතර, 17 ක් අතිරික්තවද බඳවාගෙන තිබුණි. සමාගමේ කළමනාකරණයට සම්බන්ධිත ප්‍රධානතම තනතුර වූ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමක් ආයතනය ආරම්භයේ පටන්ම සිදුකර නොතිබුණු අතර කාර්යසාධනයට අදාල වන අනුමත වූ කර්මාන්තශාලා ඉංජිනේරු තනතුරු 02න් එකක් කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන තිබුණු අතර, ඉතිරි තනතුර ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණි.

(ආ) කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අංක:ඩීඑම්එස්/1623 හා 2018 ඔක්තෝබර් 03 දිනැති ලිපිය අනුව සමාගමේ නව සේවක ව්‍යුහය සඳහා අනුමැතිය ලබා දී තිබුණද, බඳවා ගැනීම් අනුමත බඳවා ගැනීම් පටිපාටිය අනුව සිදුකල යුතු වුවත්, 2019 මාර්තු 13 විගණිත දින වන විටද, බඳවා ගැනීම් පරිපාටිය සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාගමේ පරිපාලන නිලධාරි තනතුර පුරප්පාඩුව පැවතුන අතර, එකී තනතුර සඳහා කළමනාකරණ සහකාර තනතුරේ නිලධාරිණියක් 2013/49/01 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය පරිදි 2013 නොවැම්බර් 01 දින සිට මාස 06 ක කාලසීමාවක් සඳහා වැඩ බලන පරිපාලන නිලධාරි තනතුර සඳහා පත්කර රාජකාරි ඉටුකර තිබුණි. එසේ වුවද, මාස 06 ඉකුත් වීමෙන් පසුවද දිගටම එම තනතුරේ රාජකාරි ඉටු කරමින් පැවතුණ අතර, නැවතත් සභාපතිගේ අංක:LEC/CHR/01/15 හා 2015 අප්‍රේල් 30 දිනැති ලිපිය මඟින් 2015 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 03 ක කාලයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව පත්වීම් ලබාදී තිබුණි.

එසේ වුවද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, එම කාලය තුලදී නිලධාරියෙකු බඳවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. එසේම 2015 මැයි 01 දින සිට විගණිත දිනය වූ ජුනි 03 දින දක්වාත් මෙම නිලධාරිනිය

පරිපාලන නිලධාරි තනතුරේ රාජකාරි ඉටුකරන බවද නිරීක්ෂණය විය. මේ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව වසර 04 කට අධික කාලයක් පරිපාලන නිලධාරි තනතුරේ රාජකාරි ඉටුකර තිබුණු අතර, වැඩ බැලීමේ දීමනා ලෙස 2017 සහ 2018 වර්ෂවලදී පමණක් රු132,240ක් බැගින් ගෙන තිබුණි.

(ඇ) සමාගමේ ගිණුම් නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා අංක:LEC/CHR/01/15 හා 2015 මාර්තු 06 දිනැති සභාපතිතුමාගේ ලිපිය ප්‍රකාරව කළමණාකාර සහකාර මහතෙකු මාස 03ක කාලයක් සඳහා ගිණුම් නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව පත්කර තිබුණි. එසේ වුවද, ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම නිලධාරියා දිගටම පුරප්පාඩු වූ තනතුරේ රාජකාරි ඉටුකර තිබුණු අතර, නැවතත් 2018 නොවැම්බර් 01 සිට සභාපතිතුමා විසින් තනතුරේ පුරප්පාඩුව සම්පූර්ණ වන තෙක් මෙම තනතුර සඳහා පත්කර තිබුණි. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2019 මැයි 03 විගණිත දින වන තෙක් මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය

සමාගම 2001 ඔක්තෝබර් 01 දින රජය සතු සමාගමක් ලෙස ස්ථාපනය කර තිබුණු අතර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 අගෝස්තු 15 වන ලියාපදිංචි කර තිබුණි. සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු.10/- බැගින් වූ සාමාන්‍යා කොටස් 650,000 කින් යුක්ත වූ අතර එයින් කොටස් 2 ක් පමණක් නිකුත් කර තිබුණි. එම කොටස් දෙක මහා භාන්ඩාගාරයේ ලේකම් සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් මිලදී ගෙන තිබුණි.

### 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 02 මාස 05 ක් ප්‍රමාද වී එනම්, 2019 මැයි 27 දිනදීය.

### 5.3 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති හා අංක:පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කළ යුතු වුවත්, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

සමාගම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂනය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම.<br>ii ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය නොකිරීම. |
| (ආ) තොග පාලනය | i තොග සමීක්ෂණ සිදු නොකිරිම.<br>ii පාවිච්චියට ගත නොහැකි තොග සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග නොගැනීම. |
| (ඇ) ප්‍රසම්පාදන කටයුතු පිළියෙල | ප්‍රසම්පාදන සැලැස්මක් නොකිරීම හා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකර මිලදී ගැනීම් සිදු කිරීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) වාහන පාලනය | i දෛනික ධාවන සටහන් නියමිත කාලයට අනුව පිළියෙල නොකිරීම.<br>ii ඉන්ධන පරිභරණය පරික්ෂා නොකිරීම.<br>iii දෛනික ධාවන සටහන්වල ඉන්ධන තුලනයන් සිදු නොකිරීම. |